මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

- පුවත්පත් නිවේදනයයි-

**සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනය කරන ලද**
**හියුමන් ඉමියුනොග්ලොබීන් ඖෂධය පිළිබඳ පළ වූ**
**අසත්‍ය මාධ්‍ය වාර්තා**

01. සෞඛ්‍යය අමාත්‍යාංශය විසින් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මිළදී ගෙන ඇතැයි කියනු ලබන හියුමන් ඉමියුනොග්ලොබීන් ඖෂධයට අදාලව, මහා භාණ්ඩාගාර නිලධාරීන් සම්බන්ධයෙන් විවිධ මාධ්‍යයන්හි පළවී ඇති අසත්‍ය හා නොමඟ යවන සුළු මාධ්‍ය වාර්තා සම්බන්ධයෙනි. මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කරන ලද නියෝගයක් ප්‍රකාරව අපරාධ විමර්ශණ අංශයේ නිලධාරින් වෙත උක්ත කරුණ සම්බන්ධ ලේඛන හා ඒ සම්බන්ධ ප්‍රකශයන් ලබා දෙන ලෙසට මහා භාණ්ඩාගාර ලේකම්වරයා වෙත නියෝගයක් ලැබී ඇති අතර ඒ අනුව 2023 නොවැම්බර් 27 හා 28 දෙදින මහා භාණ්ඩාගාරය වෙතට පැමිණි නිලධාරින්ට ඊට අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සම්බන්ධයෙන් සහ ඉන්දියානු ණය මාලාව යටතේ අරමුදල් භාවිතා කරන ආකාරය සම්බන්ධයෙන් තොරතුරු ලබා දි ඇත.

02. සංවර්ධන මුල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙක් හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක් මේ සම්බන්ධයෙන් දැනටමත් ප්‍රකාශ ලබාදී ඇත. එකී මාධ්‍ය වාර්තාවල පළවී ඇති පරිදි මුදල් අමාත්‍යාංශයේ කිසිදු නිලධාරියෙකු කැඳවා ප්‍රකාශ සටහන් කර ගැනීමක් සිදුවී නොමැති අතර ඖෂධ ගෙන්වීමේදී පිළිපැදිය යුතු මාර්ගෝපදේශ සම්බන්ධයෙන් හා ඒ සඳහා යොදාගෙන ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන් මෙන්ම ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ කටයුතු කිරීම පිළිබඳ අවබෝධයක් ලබා ගැනිම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහාය ලබා දි ඇත. එසේම ඊට අදාල මහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු හා සෞඛ්‍ය අමාත්‍යාංශය අතර හුවමාරු වූ ලේඛනයන්ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.

03. මෙම විශේෂිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කිසිඳු සම්බන්ධයක් නොමැත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සම්බන්ධයෙන් සහ ඉන්දියානු ණය මාලාවේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වගකිව යුතු දෙපාර්තමේන්තුව වන්නේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වේ. ඒ අනුව අදාල තොරතුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමටත් විමර්ශණය සඳහා තවදුරටත් පූර්ණ සහයෝගය ලබා දීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය කටයුතු කරනු ඇත.

04. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මෙකී සාවද්‍ය, නොමඟ යවන සුළු හා ද්වේශ සහගත ලෙස පළ කරන ලද තොරතුරු සම්බන්ධයෙන් අදාල මාධ්‍ය ආයතන වෙතට දැනුම් දීම් සිදු කර ඇත. එසේම මේ සම්බන්ධයෙන් අධිකරණය වෙත දැනුම් දීමටද මෙම සාවද්‍ය ප්‍රචාරණයන් සිදු කර ලද පුද්ගලයන් හා මාධ්‍ය ආයතන වලට එරෙහිව නිසි විමර්ශනයක් සිදු කරන ලෙස පොලිස්පතිතුමා වෙත දැනුම් දිමටද තීරණය කර ඇත.

2023.11.29